පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - චිත්‍ර

ශ්‍රේණිය - 8

සතිය- 2

Prepared by- එච්.ටී.ඩී.ජයවර්ධන

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය

Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

**2 වන වාරය - 2 වන පාඩම**

**7.2.1. හින්දු පිළිමවල ආසන , ආසන ක්‍රම හා මුද්‍රා අධ්‍යයනය කරයි.**

**ආසන වර්ග හා ආසන ක්‍රම**

**කියවීම් පත්‍රිකාව**

**හින්දු ප්‍රතිමාවල ආසන, ආසන ක්‍රම හා මුද්‍රා**

**ආසන වර්ග -**

- ප්‍රතිමාව වැඩ සිටින පීඨය ආසනය ලෙස හැඳින්වේ. පද්මය හා භද්‍රය යන ආසන හින්දු ප්‍රතිමාවල බහුල වශයෙන් දැකිය හැකි ආසන වර්ග වේ.



**පද්මාසනය** - නෙළුම් මල් පෙතිවලින් අලංකරණය කරන ලද ඕවලාකාර හැඩයක් ලෙස පද්ම ආසනය නිරූපණය කෙරේ.



**භද්‍රාසනය** - මෙය චතුරස්‍රාකාර හැඩයක් ගත් ආසනයකි.

## ආසන ක්‍රම -

- දෙපා පිහිටුවා ඇති ආකාරය ආසන ක්‍රමය ලෙස හැඳින්වේ. හින්දු ප්‍රතිමාවල බහුල වශයෙන් දැකිය හැකි ආසන ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

**ලලිත ආසන -**

පීඨය මත හිඳ සිටින ඉරියව්වකි. එක් පාදයක් නමා අනෙක් පාදය නිදහසේ පහතට දමා ගෙන සිටියි. පාර්වතී හා සරස්වතී දේවිය මෙම ඉරියව්වෙන් නිරූපණය කර ඇත.

**රාජලීලාසනය -**

වම් පය තිරස් අතට නමා සිටින අතර දකුණු පය සිරස් ව නවා ඒ මත දකුණු අතේ වැලමිට තබාගෙන සිටින ආකාරයෙන් දක්වා ඇත.

**පර්යංක ආසන -**

පුටුවක හිඳ සිටින ඉරියව්වක ආකාරයක් ගනී. මෙහි දී දෙපා නවා පහත තබාගෙන සිටින ආකාරයෙන් දක්වා ඇත.




ලලිත ආසන




රාජලීලාසනය




පර්යංක ආසන